# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1991 අංක 26 දරන
# සුරාබදු (සංශෝධන)
# පනත

---

[සහතිකය සටහන් කළේ 1991 ජූලි මස 05 වන දින]

**ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.**

---

1991 ජූලි මස 05 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය

මිල : රු. 2.70 යි. තැපැල් ගාස්තුව : රු. 3.10 යි.

1991 අංක 26 දරන සුරැකුම්පත් සභා (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1991 ජූලි මස 05 වන දින.]

එල්.ඩී.—ඕ. 62/89

## 1987 අංක 36 දරන සුරැකුම්පත් සභා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1991 අංක 26 දරන, සුරැකුම්පත් සභා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන), 1987 අංක 36 දරන සුරැකුම්පත් සභා පනතේ දීර්ඝ නාමයෙහි "ශ්‍රී ලංකාවේ සුරැකුම්පත් වෙළෙඳපොළ විධිමත් කිරීමේ කාර්ය සඳහා සුරැකුම්පත් සභාව පිහිටුවීම සඳහා ද සුරැකුම්පත් වෙළඳ ව්‍යාපාරයෙහි යෙදෙන ව්‍යාපාර වස්තු විනිමය ස්ථානවලට, ව්‍යාපාර වස්තු වෙළෙන්දන්ට සහ ව්‍යාපාර වස්තු තැරැව්කරුවන්ට" යන වචන වෙනුවට "ශ්‍රී ලංකාවේ සුරැකුම්පත් වෙළෙඳ පොළ විධිමත් කිරීමේ කාර්ය සඳහා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව පිහිටුවීම සඳහා ද, සුරැකුම්පත් වෙළෙඳ ව්‍යාපාරයෙහි යෙදෙන ව්‍යාපාර වස්තු විනිමය ස්ථානවලට, ඒකක භාරකරුවන්ට, ව්‍යාපාර වස්තු වෙළෙන්දන්ට සහ ව්‍යාපාර වස්තු තැරැව්කරුවන්ට" යන වචන ආදේශ කිරීමෙන්, එම දීර්ඝ නාමය මෙයින් සංශෝධනය කරනු ලැබේ. 1987 අංක 36 දරන පනතෙහි දීර්ඝ නාමය සංශෝධනය කිරීම.

3. (1) ප්‍රධාන ප්‍රඥප්තියෙහි සහ වෙනත් යම් ලිඛිත නීතියක— "සුරැකුම්පත් සභා පනත" "සුරැකුම්පත් සභාව" සහ "සභාව" යන්න "ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත", "ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව" සහ "කොමිෂන් සභාව" යනුවෙන් හැඳින්විය යුතු බව.

(අ) "සුරැකුම්පත් සභා පනත" යන වචන වෙනුවට "ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත" යන වචන ; සහ

(ආ) සුරැකුම්පත් සභාව හඳුන්වන "සුරැකුම්පත් සභාව" සහ "සභාව" යන වචන වෙනුවට, පිළිවෙළින් "ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව" සහ "කොමිෂන් සභාව" යන වචන

ආදේශ විය යුතු ය.

(2) කිසියම් ඇස්තමේන්තුවක, නිවේදනයක, ගිවිසුමක, පණිවිඩ හුවමාරුවක හෝ වෙනත් ලේඛනයක "සුරැකුම්පත් සභා පනත" සහ "සුරැකුම්පත් සභාව" පිළිබඳ වූ සෑම සඳහන් කිරීමක් ම, පිළිවෙළින් "ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත" සහ "ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව" පිළිබඳ වූ සඳහන් කිරීමක් ලෙස කියවා තේරුම් ගත යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය පහත දැක්වෙන ආකාර යට මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (3) වන උපවගන්තියෙහි " ඉල්ලා අස්වීම හෝ ඉවත් කරනු ලැබීම " යන වචන වෙනුවට " ඉල්ලා අස්වීම, ඉවත් කරනු ලැබීම හෝ (5) වන උපවගන්ති යෙහි විධිවිධාන ක්‍රියාත්මක වීම " යන වචන ආදේශ කිරී මෙන් ; සහ

(2) ඒ වගන්තියේ අවසානයට, පහත දැක්වෙන අලුත් උප වගන්තිය එකතු කිරීමෙන් :—

" (5) කොමිෂන් සභාවේ අවසරය කලින් ලබා නොගෙන, කොමිෂන් සභාවේ අනුගාමී රැස්වීම් තුනකට නොපැමිණෙන කොමිෂන් සභාවේ පත් කරනු ලැබූ සාමාජිකයකු, ස්වකීය ධුරය අත්හැර ගොස් ඇති ලෙස සලකනු ලැබිය යුතු ය. ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තියේ (1) වන උපවගන්ති යෙහි " රැස්වීමේ මූලාසනය දැරීම " යන වචන වෙනුවට, " එම රැස්වීමේ මූලාසනය දැරීම " යන වචන ආදේශ කිරීමෙන්, ඒ වගන් තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය සංශෝධනය කිරීම.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තියෙහි (3) වන උපවගන් තිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

" (3) කොමිෂන් සභාවේ එක් සාමාජිකයකු සහ කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජෙනරාල්වරයා හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා නොසිටින අවස්ථාවල කොමිෂන් සභාවේ ඕනෑම සාමාජිකයන් දෙදෙනකු හෝ ඉදිරිපිට දී මිස, සභාවේ මුද්‍රාව යම් සාධන පත්‍රය කට හෝ ලේඛනයකට නොතැබිය යුතු අතර, තමන් එසේ පැමිණ සිටි බවට සාක්ෂියක් වශයෙන් ඔවුන් ඒ සාධන පත්‍රයෙහි හෝ ලේඛනයෙහි හෝ අත්සන් කළ යුතු ය. ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය සංශෝධනය කිරීම.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තියෙහි (ආ) ඡේදය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

" (ආ) ආයෝජකයන්ගේ සම්බන්ධිත ආරක්ෂා කිරීම ; ".

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (ආ) ඡේදයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(ආආ) ඒකක භාරයක් පවත්වා ගෙන යාම සඳහා කළමනාකරණ සමාගමකට බලපත්‍රයක් ප්‍රදානය කිරීම සහ එම ඒකක භාරයෙහි ව්‍යාපාර කටයුතු නිසි ලෙස කරගෙන යන බවට වග බලා ගැනීම ;";

(2) ඒ වගන්තියේ (ඇ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ඇ) බලපත්‍රලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයකට හෝ කළමනාකරණ සමාගමකට හෝ බලපත්‍රලත් ඒකක භාරයක භාරකරුට හෝ බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු තැරැව්කරුවකුට හෝ ව්‍යාපාර වස්තු වෙළෙන්දකුට හෝ කලින් කල විධාන නිකුත් කිරීම ;";

(3) ඒ වගන්තියේ (එ) ඡේදය ඉවත් කිරීමෙන් ;

(4) ඒ වගන්තියේ (ඖ) ඡේදය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ඖ) යම් සුරකුම්පත් ලැයිස්තුගත කිරීම හෝ ලැයිස්තු ගත කළ සුරකුම්පත් කිසිවක් සම්බන්ධ වෙළඳාම් කිරීම් ආයෝජකයන් ආරක්ෂා කිරීම සඳහා අවලංගු කිරීම හෝ අත්හිටුවීම නැතහොත් සියලුම ලැයිස්තුගත කළ සුරකුම්පත් සම්බන්ධ වෙළඳාම් කිරීම් එක් වරකට දින තුනකට වැඩි නොවන කාල සීමාවකට අත්හිටුවීම ;";

(5) ඒ වගන්තියේ (ඵ) ඡේදයෙහි "ව්‍යාපාර වස්තු වෙළෙන්දකු හෝ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක ලැයිස්තුගත කළ පොදු සමාගම්වල ද" යන වචන වෙනුවට "ව්‍යාපාර වස්තු තැරැව්කරුවකුගේ හෝ ව්‍යාපාර වස්තු වෙළෙන්දකුගේ හෝ ඒකක භාරයක සහ පොදු සමාගම්වල" යන වචන ආදේශ කිරීමෙන් ;

(6) ඒ වගන්තියේ (ඒ) ඡේදයෙහි "යම් බලපත්‍රලත් ව්‍යාපාර වස්තු වෙළෙන්දකු විසින් හෝ ව්‍යාපාර වස්තු තැරැව්කරු වකු විසින් හෝ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක ලැයිස්තුගත කළ" යන වචන වෙනුවට "යම් බලපත්‍රලත් ව්‍යාපාර වස්තු තැරැව්කරුවකු විසින් හෝ ව්‍යාපාර වස්තු වෙළෙන්දකු විසින් හෝ බලපත්‍රලත් ඒකක භාරයක භාරකරු නැතහොත් කළමනාකරණ සමාගම

විසින් හෝ බලපත්‍රලත් අන්‍යෝන්‍ය අරමුදලක රැකවරණ කරු නැතහොත් කළමනාකරණ සමාගම විසින් හෝ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක ලැයිස්තුගත කළ" යන වචන ආදේශ කිරීමෙන් ;

(7) ඒ වගන්තියේ (ග) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේද ආදේශ කිරීමෙන් :—

"(ග) 1982 අංක 17 දරන සමාගම් පනතේ 227 වන වගන්තියෙන් සමාගම් රෙජිස්ට්‍රාර්වරයා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින්, සීමිත වගකීම් සහිත පුද්ගලික සමාගමකට, සීමිත වගකීම් සහිත පොදු සමාගමක් බවට පත්වන ලෙසට නියම කරන මෙන්, එම රෙජිස්ට්‍රාර්වරයාගෙන් ඉල්ලා සිටීම; සහ

(ච) මෙම පනත යටතේ කොමිෂන් සභාවේ අරමුණු ඉෂ්ට කර ගැනීමට හෝ එහි බලතල ක්‍රියාවේ යෙදවීමට හෝ ආනුෂංගික වන්නා වූ නැතහොත් උපකාරි වන්නා වූ වෙනත් සියලු ක්‍රියා කිරීම ;".

ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය සංශෝධනය කිරීම.

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය, පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) ඒ වගන්තියේ (අ) ඡේදය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(අ) බලපත්‍රලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථාන, ව්‍යාපාර වස්තු තැරැව්කරුවන්, ව්‍යාපාර වස්තු වෙළෙන්දන් සහ ඒකක භාර විසින් මේ පනතේ විධිවිධානවලට හෝ ඒ යටතේ සාදන ලද කිසියම් රීතිවලට හෝ නියෝගවලට හෝ අනුකූලව තම කටයුතු කරගෙන යත්දැයි තීරණය කිරීම සඳහා ඒවායේ ක්‍රියාකාරකම් පිළිබඳව සෝදිසි කිරීම් පැවැත්වීමට සහ එම සෝදිසි කිරීම් කරගෙන යාමේ දී දරන ලද වියදම් , ක්‍රියාකාරකම් සෝදිසි කරනු ලැබූ බලපත්‍රලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානවලින්, ව්‍යාපාර වස්තු තැරැව්කරුවන්ගෙන්, ව්‍යාපාර වස්තු වෙළෙන්දන්ගෙන් හෝ ඒකක භාරයේ කළමනාකරණ සමාගමෙන් අයකර ගැනීම ;"; සහ

(2) ඒ වගන්තියේ (ආ) ඡේදයෙහි "බලපත්‍රලත් ව්‍යාපාර වස්තු වෙළෙන්දන්ට සහ ව්‍යාපාර වස්තු තැරැව්කරුවන්ට" යන වචන වෙනුවට, "බලපත්‍රලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානවලට, ව්‍යාපාර වස්තු තැරැව්කරුවන්ට, ව්‍යාපාර වස්තු වෙළෙන්දන්ට සහ බලපත්‍රලත් ඒකක භාරවල කළමනාකරණ සමාගම්වලට" යන වචන ආදේශ කිරීමෙන් ;

(3) ඒ වගන්තියේ අවසානයට පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන් :—

"(ඇ) බලපත්‍රලත් ඒකක භාරයෙහි ඒ වර්ෂය සඳහා වූ ක්‍රියාකාරකම් පිළිබඳව යටත් පිරිසෙයින් වාර්තා දෙකක්, සෑම වර්ෂයක් වෙනුවෙන් ම කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලෙස, බලපත්‍රලත් ඒකක භාරයෙහි කළමනාකරණ සමාගම වෙත නියම කිරීම. එවැනි සෑම වාර්තාවක ම, නියමිත විස්තර අඩංගු විය යුතු ය. පළමුවන වාර්තාව ඒ වර්ෂයේ සැප්තැම්බර් මාසයේ තිස් එක් වන දිනයට පෙරාතුව ද, දෙවන වාර්තාව තදනන්තර වර්ෂයේ මාර්තු මස තිස් එක් වන දිනයට පෙරාතුව ද ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.".

10. ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තියේ "මෙහි උපලේඛනයේ II වන කොටසෙහි දක්වා ඇති" යන වචන වෙනුවට, "මෙහි උපලේඛනයේ III වන කොටසෙහි දක්වා ඇති" යන වචන ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය සංශෝධනය කිරීම.

11. 18 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 18අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය:—

18අ අලුත් වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුළත් කිරීම.

"සාවද්‍ය හෝ අසත්‍ය තොරතුරු සැපයීම.

18අ. (1) ව්‍යාපාර වස්තු තැරැව්කරුවකු හෝ ව්‍යාපාර වස්තු වෙළෙන්දකු හෝ විසින් සපයනු ලැබූ විස්තර පදනම් කරගෙන ව්‍යාපාර වස්තු තැරැව්කරුවකු හෝ ව්‍යාපාර වස්තු වෙළෙන්දකු හෝ වෙත බලපත්‍රයක් ප්‍රදානය කරනු ලැබ තදනන්තරව ඒ විස්තර සාවද්‍ය හෝ අසත්‍ය බවට පෙනී ගොස් ඇති අවස්ථාවක, කොමිෂන් සභාව විසින්, එම ව්‍යාපාර වස්තු තැරැව්කරු හෝ ව්‍යාපාර වස්තු වෙළෙන්දා වෙත ප්‍රදානය කරන ලද බලපත්‍රය, නිශ්චිත කාලයක් සඳහා අත්හිටුවනු ලැබිය යුතු අතර, එම අත්හිටුවීමේ කාලසීමාව අවසන් වීමට පෙර නිවැරදි විස්තර සපයන ලෙස, එම ව්‍යාපාර, කොටස් තැරැව්කරුගෙන් හෝ ව්‍යාපාර වස්තු කොටස් වෙළෙන්දාගෙන් හෝ ඉල්ලා සිටිනු ලැබිය යුතු ය. එම විස්තර ලැබුණු විට, ඒවා සලකා බැලීමෙන් පසුව, කොමිෂන් සභාව විසින් එම අත්හිටුවීමේ නියමය ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ කරන ලද ඉල්ලීමකට අනුව, ඒ උපවගන්තිය යටතේ නියම කරනු ලැබූ කාලසීමාව ඇතුළත විස්තර සපයනු නොලබන්නා වූ හෝ සපයන ලද තොරතුරු සලකා බලා අත්හිටුවීමේ නියමය ප්‍රත්‍යාදිෂ්ට නොකළ යුතු බවට කොමිෂන් සභාව තීරණය කරන්නා වූ හෝ අවස්ථාවක, කොමිෂන් සභාව විසින් බලපත්‍රය අවලංගු කරනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය සංශෝධනය කිරීම.

12. ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තියේ (1) වන උප වගන්තිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

" (1) බලපත්‍රලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක් විසින් ස්වකීය බලපත්‍රය අලුත් කරවා ගැනීම සඳහා නියමිත ආකෘති පත්‍රයෙහි වූ ඉල්ලුම් පත්‍රයක්, නියමිත ගාස්තුව ද සමග එකී බලපත්‍රයේ කාලය ඉකුත් වීමට පෙර වූ මාස හය ඇතුළත කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය හැකි ය. ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය සංශෝධනය කිරීම.

13. ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (2) වන උපවගන්තියෙහි " අවලංගු කිරීමට පෙර " සහ " බලපත්‍රය අවලංගු නොකළ යුත්තේ " යන වචන වෙනුවට, පිළිවෙලින්, " අවලංගු කිරීමට හෝ අත්හිටුවීමට හෝ පෙර " සහ " බලපත්‍රය අවලංගු කිරීම හෝ අත්හිටුවීම හෝ නොකළ යුත්තේ " යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ අවසානයට පහත දැක්වෙන අලුත් උපවගන්ති එකතු කිරීමෙන් :—

" (4) බලපත්‍රලත් ව්‍යාපාර වස්තු නැරැවිකරුවකු හෝ ව්‍යාපාර වස්තු වෙළෙන්දකු විසින් (1) වන උපගවන්තියේ (අ) හෝ (ආ) හෝ (ඇ) හෝ (ඈ) ඡේදවල විධිවිධාන උල්ලංඝනය කර ඇති බවට සහ එම උල්ලංඝනය කිරීම බරපතල ස්වභාවයේ උල්ලංඝනය කිරීමක් නොවන බවට කොමිෂන් සභාව සෑහීමට පත්වන අවස්ථාවක, කොමිෂන් සභාව විසින් (1) වන උපවගන්තිය යටතේ ක්‍රියා කරනු ලැබීම වෙනුවට,—

(අ) එම උල්ලංඝනය කිරීමේ ප්‍රතිඵලයෙන් ඇති වූ තත්ත්වය නිවැරදි කිරීමට හෝ හරිගැස්සීමට ; හෝ

(ආ) මේ පනතේ විධිවිධාන අනුව හෝ මේ පනත යටතේ සාදන ලද කිසියම් රීතියක් හෝ නියෝගයක් අනුව ක්‍රියා කිරීමට නැතහොත්, එම උල්ලංඝනය කිරීම තවදුරටත් කරගෙන යාමෙන් වැළකී සිටීමට

සුදුසු යයි කොමිෂන් සභාව සලකන යම් හෝ ක්‍රියා මාර්ගයක් ගන්නා ලෙස, එම බලපත්‍රලත් ව්‍යාපාර වස්තු නැරැවිකරුට හෝ ව්‍යාපාර වස්තු වෙළෙන්දාට විධාන කරනු ලැබිය හැකි ය.

(5) බලපත්‍රලත් ව්‍යාපාර වස්තු තැරැව්කරුවකු හෝ ව්‍යාපාර වස්තු වෙළෙන්දකු හෝ වෙත කොමිෂන් සභාව විසින් (4) වන උපවගන්තිය යටතේ විධානයක් කරනු ලැබීමෙන්, එම ව්‍යාපාර වස්තු තැරැව්කරුට හෝ ව්‍යාපාර වස්තු වෙළෙන්දාට හෝ එරෙහිව මේ පනත යටතේ වරදක් සඳහා නඩු පැවරීමක් හෝ නඩුවක් පවත්වාගෙන යාම හෝ කෙරෙහි බලපෑමක් හෝ ඊට අගතියක් නොවන්නේ ය.

**14.** ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තියේ (1) වන උප වගන්තියේ (ආ) ඡේදයෙහි "21 වන වගන්තිය යටතේ" යන වචන වෙනුවට "18අ වන සහ 21 වන වගන්ති යටතේ" යන වචන ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය සංශෝධනය කිරීම.**

**15.** ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තියෙහි, "ඉතිරිව පවතින ශිෂ්ඨසුම්, අවස්ථාවෝචිත පරිදි" යන වචන වෙනුවට "සුරැකුම්පත් පිළිබඳ ගනුදෙනුවලට අදාළව ඉතිරිව පවතින ශිෂ්ඨසුම්, අවස්ථාවෝචිත පරිදි" යන වචන ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය සංශෝධනය කිරීම.**

**16.** 23 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 23අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය :—

**23අ අලුත් වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුළත් කිරීම.**

"බලපත්‍රලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක පරිපාලනය සහ කළමනාකරණය අත් කර ගැනීම.

23අ. (1) බලපත්‍රලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක පරිපාලනය සහ කළමනාකරණය පොදු යහපත උදෙසා අත් කර ගැනීම අවශ්‍ය යයි කොමිෂන් සභාවෙහි මතය වන අවස්ථාවක, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන දැන්වීමක් මගින්, එම දැන්වීමෙහි නිශ්චය කරනු ලබන කාලසීමාවක් සඳහා එම ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයෙහි පාලනය සහ කළමනාකරණය කොමිෂන් සභාව විසින් අත් කර ගනු ලැබිය හැකි ය. ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන තදනන්තර දැන්වීමක් මගින්, පළමු දැන්වීමෙහි නිශ්චිත කාල සීමාව කොමිෂන් සභාව විසින් දීර්ඝ කරනු ලැබිය හැකි ය. එවැනි සෑම දැන්වීමක ම පිටපතක් කොමිෂන් සභාව විසින් සමාගම් රෙජිස්ට්‍රාර්වරයා වෙත යැවීමට සලස්වනු ලැබිය යුතු ය. එම රෙජිස්ට්‍රාර්වරයා, එම ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය පවත්වා ගෙන යාමේ ව්‍යාපාරය කරගෙන යාම පිණිස බලපත්‍ර ලබා ඇති සමාගමට අදාළ ලේඛනවල ඒ පිළිබඳව සටහනක් කළ යුතු ය.

(2) බලපත්‍රලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක පරිපාලනය සහ කළමනාකරණය කොමිෂන් සභාව විසින් අත්කර ගන්නා ලද අවස්ථාවක, කොමිෂන් සභාව විසින්, එම ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයේ ලැයිස්තුගත සමාගම්වල ආයෝජකයන්ගේ අයිතිවාසිකම් කෙරෙහි සැලකිලිමත්ව, එම ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයේ කළමනාකරණය සඳහා යම් තැනැත්තකු සමග ගිවිසුමකට එළඹීම, කොමිෂන් සභාව සහ එම තැනැත්තා අතර එකඟත්වයට එළඹෙන කොන්දේසිවලට යටත්ව කරනු ලැබිය හැකි ය.

(3) බලපත්‍රලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක පරිපාලනය සහ කළමනාකරණය කොමිෂන් සභාව විසින් අත්කර ගනු ලබන අවස්ථාවක, කොමිෂන් සභාව විසින් හෝ, කොමිෂන් සභාව (2) වන උපවගන්තිය යටතේ යම් තැනැත්තකු සමග ගිවිසුමකට එළඹ ඇති අවස්ථාවක දී ඒ තැනැත්තා විසින් හෝ,—

(අ) කිසියම් ලිඛිත නීතියක් මගින් හෝ එම ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය පවත්වාගෙන යාමේ ව්‍යාපාරය කරගෙන යාම පිණිස බලපත්‍ර ලබා ඇති සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලිය මගින් හෝ ඒ යටතේ බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයකට පවරා ඇති හෝ නියම කර ඇති හෝ වෙන් කර දී ඇති සියලු බලතල, කර්තව්‍යයන් සහ කාර්යයන්, එම ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයට අදාළව ක්‍රියාවේ යෙදවීම, කිරීම සහ ඉටු කිරීම කරනු ලැබිය හැකි අතර, කොමිෂන් සභාව නැතහොත් ඒ තැනැත්තා විසින් කරනු ලබන එවැනි සෑම ක්‍රියාවේ යෙදවීමක්, කිරීමක් සහ ඉටු කිරීමක් ම, එම බලපත්‍රලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය විසින් කරනු ලැබූ ලෙස වලංගු සහ බලසහිත විය යුතු ය ; තව ද

(ආ) (1) වන උපවගන්තියෙහි සඳහන් දැන්වීම පළ කරන ලද දිනයට පෙරාතුව ම වූ දින යෙහි බලපත්‍රලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය විසින් පරිහරණය කරන ලද චංචල හෝ නිශ්චල දේපළ කිසිවක්, එකී බලපත්‍රලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය පවත්වා ගෙන යාමේ ව්‍යාපාරය කරගෙන යාමේ කාර්ය සඳහා තම සන්තකයට ගැනීම සහ පරිහරණය කිරීම කරනු ලැබිය හැකි ය.

(4) බලපත්‍රලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථාන යක පරිපාලනය සහ කළමනාකරණය කොමිෂන් සභාව විසින් අත්කර ගනු ලැබ ඇත්තේ යම් කාල සීමාවක් සඳහා ද ඒ කාල සීමාව තුළ දී, කිසියම් ලිඛිත නීතියක් මගින් හෝ ඒ යටතේ නැතහොත් එම ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය පවත්වා ගෙන යාමේ ව්‍යාපාරය කරගෙන යාම පිණිස බලපත්‍ර ලබා ඇති සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලිය මගින් හෝ එම බලපත්‍රලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයට පවරා ඇති හෝ නියම කර ඇති හෝ වෙන් කර දී ඇති බලතල, කර්තව්‍ය හෝ කාර්යයන් කිසිවක් ක්‍රියාවේ යෙදවීමට, කිරීමට හෝ ඉටු කිරීමට කොමිෂන් සභාව විසින්, එම බලපත්‍රලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයේ අධ්‍යක්ෂවරයකුට හෝ නිලධර යකුට ප්‍රකාශිතව ම බලය පවරා දී ඇත් නම් මිස, ඒ සෑම අධ්‍යක්ෂවරයකු හා නිලධරයකු ම, එකී බලතල ක්‍රියාවේ යෙදවීම, කර්තව්‍යයන් කිරීම හෝ කාර්යයන් ඉටු කිරීම නතර කළ යුතු ය.

(5) (1) වන උපවගන්තිය යටතේ පළ කරන ලද දැන්වීමෙහි නිශ්චිත කාල සීමාව අවසන් වීමට පෙර ඕනෑම අවස්ථාවක දී, එම ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයේ රීතිවලට අනුකූලව එහි අධ්‍යක්ෂ මණ්ඩලය නැවත සංස්ථාපනය කරන ලෙස, කොමිෂන් සභාව විසින් බලපත්‍රලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයකට දන්වා සිටිය හැකි අතර, එසේ නැවත සංස්ථාපනය කිරීමෙන් පසුව සහ එම කාල සීමාව අවසන් වූ විට, (3) වන උපවගන්තිය යටතේ සන්තකයට ගන්නා ලද දේපළ, නැවත සංස්ථාපනය කරන ලද අධ්‍යක්ෂ මණ්ඩලය වෙත භාර දෙනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය සංශෝධනය කිරීම.

17. ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) ඒ වගන්තියේ (2) වන උපවගන්තියෙහි "වෙනස් කිරීමෙන් හෝ එකතු කිරීමෙන්" යන වචන වෙනුවට "වෙනස් කිරීමෙන් හෝ එකතු කිරීමෙන්" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ අවසානයට පහත දැක්වෙන උපවගන්තිය එකතු කිරීමෙන් :—

"(5) මේ වගන්තියේ (3) වන සහ (4) වන උපවගන්ති වල කුමක් සඳහන්ව ඇත ද ව්‍යාපාර වස්තු විනිමය ස්ථාන යක පිහිටලට කරනු ලබන, කොමිෂන් සභාව විසින් තත් කාර්යය සඳහා සාදන ලද රීති මඟින් නියමිත වර්ගවල සංශෝධන (2) වන උපවගන්තියෙහි සඳහන් ලියවිල්ලකින් වූ දැන් වීම ඉදිරිපත් කළ වහාම ක්‍රියාත්මක විය යුතු ය. එසේ වුව ද, එම සංශෝධනය ක්‍රියාත්මක වීමෙන් දින විසි එකක් ඇතුළත දී, එය යටතේ කලින් කරන ලද කිසිවකට අගතියක් නොමැතිව, කොමිෂන් සභාව විසින්, එම සංශෝධන යට ඉඩ නොදී, මේ වගන්තියේ (4) වන උපවගන්තියේ විධිවිධාන අනුව ක්‍රියා කරන ලෙස ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයට උපදෙස් දෙනු ලැබීමේ කොන්දේසියට මෙය යටත් වන්නේ ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තිය සංශෝධනය කිරීම.

18. ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) ඒ වගන්තිය එම වගන්තියෙහි (1) වන උපවගන්තිය ලෙස නැවත අංක කිරීමෙන් ;

(2) නැවත අංක කරන ලද (1) වන උපවගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් වගන්තිය එකතු කිරීමෙන් :—

"(2) මේ වගන්තියේ (1) වන උපවගන්තියේ අඩංගු විධිවිධානවල කුමක් සඳහන් ව ඇත ද, කොමිෂන් සභාව විසින් තත් කාර්යය සඳහා සාදන ලද රීති මගින් නිශ්චිතව නියම කරනු ලබන වර්ගවල යම් වෙනස් කිරීම්, ඒ වෙනස් කිරීම් පිළිබඳව කොමිෂන් සභාව වෙත දැන් වූ වහාම ක්‍රියාත්මක විය යුතුය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය සංශෝධනය කිරීම.

19. ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තියෙහි "වරදකට වරද කරු වන අතර" යන වචන වෙනුවට "වරදකට වරදකරු වන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු" යන වචන ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

20. ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය මෙයින් ආදේශ කරනු ලැබේ:—

ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"ලැයිස්තුගත කරන ලද සුරැකුම්පත් මිලට ගැනීම විකිණීම යනාදිය.

28. (1) (අ) බලපත්‍රලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක ලැයිස්තුගත කරන ලද පොදු සමාගමක කොටස් දරන කිසිම තැනැත්තකු, එම බලපත්‍රලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය විසින් උපයෝගි කර ගනු ලබන වෙළෙඳ කාර්ය පටිපාටියට අනුකූලව මිස, කොමිෂන් සභාවේ පූර්ණ අනුමතිය නොමැතිව ඒ කොටස් මිලට ගැනීම, විකිණීම, තෑගි කිරීම හෝ ඒවා සම්බන්ධයෙන් අන් ආකාරයකින් ගනුදෙනු කිරීම නොකළ යුතු ය:

එසේ වුව ද යෝජිත තෑගි කිරීම පිළිබඳ විස්තර යම් තැනැත්තකු විසින් කොමිෂන් සභාව වෙත සහ බලයලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය වෙත කලින් දැනුම් දෙනු ලැබුවහොත්, එකී වෙළඳ කාර්ය පරිපාටියට වෙනස් ලෙස ඔහු විසින් එවැනි යම් කොටසක් ඥාතියකුට තෑග කරනු ලැබිය හැකි ය.

(ආ) බලපත්‍රලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක ලැයිස්තුගත කරන ලද පොදු සමාගමක කොටස් දරන තැනැත්තකු මිය ගිය විට, කොමිෂන් සභාවේ අනුමතිය ඇතිව මිස, වෙනත් යම් තැනැත්තකුගේ නමින් ඒ කොටස් ලියාපදිංචි නොකරනු ලැබිය යුතු ය.

මේ උපවගන්තියෙහි යම් තැනැත්තකුට අදාළව "ඥාතියකු" යන්නෙන් ඒ තැනැත්තාගේ දෙමව්පියන්ගෙන් කෙනකු, භාර්යාව හෝ පුරුෂයා හෝ දරුවකු හෝ ඒ තැනැත්තාගේ දරුවකුගේ භාර්යාව හෝ පුරුෂයා අදහස් වේ.

(2) යම් බලපත්‍රලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක්. ව්‍යාපාර වස්තු තැරැව්කරුවෙක් හෝ ව්‍යාපාර වස්තු වෙළෙන්දෙක්, ලැයිස්තුගත කරන ලද සුරැකුම්පත් කිසිවක් මිලදී ගැනීම, විකිණීම හෝ ඒවා පිළිබඳව අන් දෙයක් කිරීම සම්බන්ධයෙන් කෙළින්ම හෝ අන්‍යාකාරයකින්—

(අ) යම් තැනැත්තකුට වංචා කිරීමේ අදහසින් කිසියම් උපක්‍රමයක් යෙදීම හෝ ප්‍රයෝගයක් කිරීම;

(ආ) යම් තැනැත්තකු කෙරෙහි වංචාවක් හෝ කපටිකමක් වශයෙන් ක්‍රියාත්මක වන කිසියම් ව්‍යාපාරික පරිචයක හෝ ක්‍රියා මාර්ගයක හෝ නිරතවීම; හෝ

(ඈ) වැදගත් කාරණයක් සම්බන්ධයෙන් අසත්‍ය හෝ නොමග යවන සුළු ප්‍රකාශයක් කිරීම හෝ, කරන ලද ප්‍රකාශයක් අසත්‍ය හෝ නොමග යවන සුළු නොවීම සඳහා අවශ්‍ය වැදගත් කරුණක් ප්‍රකාශ කිරීම පැහැර හැරීම

නොකළ යුතුය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය ප්‍රතිස්ථාපනය කිරීම.

21. ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන ගන්තිය ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය මෙයින් ආදේශ කරනු ලැබේ:—

"බලපත්‍රලත් ව්‍යාපාර වස්තු තැරැව්කරුවන් සහ ව්‍යාපාර වස්තු වෙළෙන්දන් විසින් ලැයිස්තුගත කළ සුරකුම්පත් වෙළෙඳාම් කිරීම හෝ අන් ලෙසකින් ගනුදෙනු කිරීම.

29. කිසිම බලපත්‍රලත් ව්‍යාපාර වස්තු තැරැව්කරුවකු හෝ බලපත්‍රලත් ව්‍යාපාර වස්තු වෙළෙන්දකු විසින්—

(අ) කොමිෂන් සභාවේ පූර්ව අනුමතිය නොමැතිව, තමා සාමාජිකයකුව සිටින බලපත්‍රලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයෙන් බාහිරව, ලැයිස්තුගත කළ සුරකුම්පත් වෙළෙඳාම් කිරීම හෝ අන් ආකාරයකින් ගනුදෙනු කිරීම හෝ කරනු නොලැබිය යුතු ය;

(ආ) ලැයිස්තුගත කළ සුරකුම්පත් නිෂ්කාශනය කිරීමට, බේරුම් කිරීමට, ගෙවීමට සහ බාර දීමට අදාළව කොමිෂන් සභාව විසින් සකස් කරනු ලබන රීති උල්ලංඝනය වන ආකාරයකට ලැයිස්තුගත කළ සුරකුම්පත් වෙළෙඳාම් කරනු නොලැබිය යුතු ය;

(ඇ) කොමිෂන් සභාවේ පූර්ව අනුමැතිය නොමැතිව තමා සාමාජිකයකුව සිටින බලපත්‍රලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය විසින් දක්වා ඇති නියමයන්ට පටහැනි වන ආකාරයට ආත්තික ගිණුමක ගනුදෙනු කිසිවක් කරනු නොලැබිය යුතු ය;

(ඈ) ලැයිස්තුගත කළ සුරකුම්පත් කිසිවක් මිලට ගැනීමට හෝ විකිණීමට හෝ පෙලඹවීම පිණිස හෝ පෙලඹවීමට තැත් කිරීම පිණිස කිසියම් උපක්‍රමශීලී, මුලාකාරී හෝ වෙනත් වංචාකාරී ක්‍රමයක් නැතහොත් ප්‍රයෝගයක් මගින්, කිසියම් ගනුදෙනුවක් කරනු නොලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තිය සංශෝධනය කිරීම.

22. ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක් වශයෙන්" යන වචන වෙනුවට "ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක් වශයෙන්" යන වචන ආදේශ කිරීමෙන්;

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ "වරදකට වරදකරු වන අතර" යන වචන වෙනුවට "වරදකට වරදකරු වන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු" යන වචන ආදේශ කිරීමෙන්.

අලුත් IIIඅ කොටස ප්‍රධාන ප්‍රඥප්තියට ඇතුළත් කිරීම.

23. ප්‍රධාන ප්‍රඥප්තියේ III වන කොටසට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් කොටස මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එම කොටස ප්‍රධාන ප්‍රඥප්තියේ IIIඅ කොටස ලෙස ක්‍රියාත්මක විය යුතු ය:—

"IIIඅ කොටස

ඒකක භාරයකට බලපත්‍ර ප්‍රදානය කිරීම

ඒකක භාරයක් පවත්වාගෙන යාමට බල පත්‍රයක් ප්‍රදානය කිරීම.

31අ. ඒකක භාරයක් පවත්වා ගෙන යාමට අදහස් කරන කළමනාකරණ සමාගමක් විසින් එවැනි ඒකක භාරයක් පවත්වා ගෙන යාම සඳහා බලපත්‍රයක් ප්‍රදානය කරනු ලැබීම පිණිස නියමිත ආකෘතියෙහි වූ ඉල්ලුම් පත්‍රයක්, නියමිත ගාස්තුව ද සමග කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය. එවැනි සෑම ඉල්ලුම් පත්‍රයක් සමගම, නියමිත ලේඛන අමුණා තිබිය යුතු ය.

මේ කොටස යටතේ බල පත්‍රයක් ප්‍රදානය කරනු ලැබීම සඳහා අනුගමනය කළ යුතු නියම සහ කොන්දේසි.

31ආ. ඒකක භාරයක් මෙම උපලේඛනයේ IV වන කොටසෙහි ඇති නියම සහ කොන්දේසිවලට අනුකූල වන්නේ නම් මිස, ඒකක භාරයක් පවත්වා ගෙන යාම සඳහා මේ කොටස යටතේ කිසිම බලපත්‍රයක් ප්‍රදානය කරනු නොලැබිය යුතු ය.

බලපත්‍රය ප්‍රදානය කිරීම.

31ඇ. 31අ වගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද ඉල්ලුම් පත්‍රයක් ලැබුණු විට, කොමිෂන් සභාව විසින්, එහි සඳහන් විස්තර සහ ඉල්ලුම් පත්‍රය සමග එවන ලද ලේඛන සලකා බලා, අවශ්‍ය යයි සලකන අවස්ථාවල, පෞද්ගලිකව ම හෝ නියෝජිතයකු මගින් හෝ ඉල්ලුම්කරුට සවන්දීමේ අවස්ථාවක් ඉල්ලුම්කරු වෙත සැලසිය යුතු අතර ඔහුට බලපත්‍රයක් ප්‍රදානය කරන්නේ ද නැද්ද යන වග ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින් ඉල්ලුම්කරු වෙත දන්වනු ලැබිය යුතු ය.

ඒකක භාරයක් වෙත ප්‍රදානය කරන ලද බලපත්‍රයක් අවලංගු කිරීම.

31ඇ. (1) ඒකක භාරයක් වෙනුවෙන් ප්‍රදානය කරන ලද බලපත්‍රයක්—

(අ) එම ඒකක භාරයේ භාරකරු හෝ කළමනාකරණ සමාගම විසින් මෙම පනතේ විධිවිධාන කිසිවක් හෝ මේ පනත යටතේ සාදන ලද රීති නැතහොත් නියෝග කිසිවක් උල්ලංඝනය වන ආකාරයට ක්‍රියා කර ඇති බවට ; හෝ

(ආ) එම ඒකක භාරයේ භාරකරු හෝ කළමනාකරණ සමාගම යහපත් ආර්ථික ස්ථාවරයක් දැරීම නතර වී ඇති බවට ; හෝ

(ඇ) බලපත්‍රය ප්‍රදානය කරනු ලැබීමෙන් පසුව, කළමනාකරණ සමාගම, බලපත්‍රය ප්‍රදානය කරනු ලැබීම සඳහා නුසුදුසු වී ඇති බවට ; හෝ

(ඈ) එම ඒකක භාරයේ භාරකරු හෝ කළමනාකරණ සමාගම එහි කටයුතු කළමනාකරණය කිරීමේ දී, අයථා ක්‍රියා හෝ අක්‍රමිකතා හෝ සම්බන්ධයෙන් වරදකරු වී ඇති බවට ; හෝ

(ඉ) ඒ බලපත්‍රලත් ඒකක භාරයේ භාරකරු විසින් ඒ බලපත්‍රලත් ඒකක භාරයේ කළමනාකරණ සමාගම අස්කර ඇති බවට,

කොමිෂන් සභාව සෑහීමට පත්වන අවස්ථාවක, කොමිෂන් සභාව විසින් එම බලපත්‍රය අවලංගු කිරීම හෝ අත්හිටුවීම හෝ කරනු ලැබිය හැකි ය.

(2) ඉහත සඳහන් උපවගන්තියේ විධිවිධාන ප්‍රකාර, ඒකක භාරයක් වෙනුවෙන් ප්‍රදානය කරන ලද බලපත්‍රයක් අවලංගු කිරීමට පෙර, ඒ බලපත්‍රය අවලංගු නොකළ යුත්තේ මන්ද යන්න පිළිබඳව හේතු දැක්වීමට අවස්ථාවක් බලපත්‍රලාභියා වෙත ලබා දෙනු ලැබිය යුතු ය.

(3) ඒකක භාරයක් වෙනුවෙන් ප්‍රදානය කරන ලද බලපත්‍රය, අවලංගු කරනු ලැබූ අවස්ථාවක, තම බලපත්‍රය නොපමාව ම කොමිෂන් සභාව වෙත භාරදීම, බලපත්‍රලාභියාගේ යුතුකම විය යුතු ය.

(4) ඒකක භාරයක භාරකරු හෝ කළමනාකරණ සමාගම විසින් (1) වන උපවගන්තියේ (අ) හෝ (ආ) හෝ (ඇ) හෝ (ඈ) ඡේදවල විධිවිධාන උල්ලංඝනය කර ඇති බවට සහ එම උල්ලංඝනය

කිරීම් බලපත්‍රල ස්වභාවයේ උල්ලංඝනය කිරීම් නොවන බවට කොමිෂන් සභාව සැලකීමට පත්වන අවස්ථාවක, කොමිෂන් සභාව විසින් (1) වන උප වගන්තිය යටතේ ක්‍රියා කිරීම වෙනුවට,—

(අ) එම උල්ලංඝනය කිරීමේ ප්‍රතිඵලයෙන් ඇති වූ තත්වය නිවැරදි කිරීම හෝ හරි ගැස්සීම සඳහා ; හෝ

(ආ) මේ පනතේ විධිවිධාන අනුව හෝ මේ පනත යටතේ සාදන ලද කිසියම් රීතියක් හෝ නියෝගයක් අනුව ක්‍රියා කිරීම සඳහා නැත්හොත් එම උල්ලංඝනය කිරීම තව දුර වත් කරගෙන යාමෙන් වැළකී සිටීම සඳහා

සුදුසුයැයි කොමිෂන් සභාව සලකන යම් ක්‍රියා මාර්ගයක් ගන්නා ලෙස එම භාරකරුට හෝ කළමනාකරණ සමාගමට හෝ විධාන කරනු ලැබිය හැකි ය.

(5) භාරකරුවකු හෝ කළමනාකරණ සමාගමක් වෙත, කොමිෂන් සභාව විසින් (4) වන උපවගන්තිය යටතේ විධානයක් කරනු ලැබීම හේතුකොට ගෙන, එම භාරකරුට හෝ කළමනාකරණ සමාගමට එරෙහිව මේ පනත යටතේ වරදක් සඳහා නඩු පැවරීමක් හෝ නඩුවක් පවත්වාගෙන යාමක් කෙරෙහි බලපෑමක් හෝ ඊට අගතියක් සිදු නොවන්නේ ය.

ප්‍රතික්ෂේප කිරීමක්, අවලංගු කිරීමක් හෝ අත්හිටුවීමක් සම්බන්ධයෙන් අභියාචනය.

31ඉ. (1) කොමිෂන් සභාව විසින්,—

(අ) 31අ වගන්තිය යටතේ බලපත්‍රයක් ප්‍රදානය කිරීම ප්‍රතික්ෂේප කිරීමට ;

(ආ) 31ඈ වගන්තිය යටතේ බලපත්‍රයක් අවලංගු කිරීමට නැතහොත් අත්හිටුවීමට

ගන්නා ලද තීරණයකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින්, අවස්ථෝචිත පරිදි එම ප්‍රතික්ෂේප කිරීමට, අවලංගු කිරීමට හෝ අත්හිටුවීමට විරුද්ධව අභියාචනයක් එම තීරණය එම තැනැත්තා වෙත දන්වනු ලැබූ දිනයෙහි සිට මාස තුනක් ඇතුළත දී, අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින්, තමා සෑහීමට පත්වන පරිදි, කොමිෂන් සභාවේ තීරණයට හේතු ඉදිරිපත් කරන ලෙස කොමිෂන් සභාව වෙත නියම කරනු ලැබිය හැකි අතර ඒ ලේකම්වරයා විසින් අභියාචනය ලැබී මාස තුනක් ඇතුළත දී ඔහුගේ තීරණය, අභියාචනය ඉදිරිපත් කළ තැනැත්තා වෙත දන්වනු ලැබිය යුතු ය.

(3) අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ තීරණයෙන් අතෘප්තියට පත් ඉල්ලුම්කරුවකු විසින් එම තීරණය තමා වෙත දන්වනු ලැබූ දිනයෙහි සිට දින දහ හතරක් ඇතුළත දී, එම තීරණයට විරුද්ධව අභියාචනාධිකරණය වෙත අභියාචනය කළ හැකි ය.

(4) මේ වගන්තිය යටතේ වූ අභියාචනවලට අදාළව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 136 වන ව්‍යවස්ථාව යටතේ රීති සාදනු ලබන තුරු, අභියාචනාධිකරණය වෙත කරනු ලබන ප්‍රතිශෝධන ඉල්ලීම්වලට අදාළව ඒ ව්‍යවස්ථාව යටතේ සාදනු ලැබූ රීති, මේ වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ කරනු ලබන සෑම අභියාචනයක් සම්බන්ධයෙන් ම, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ විය යුතු ය.

(5) මේ වගන්තිය යටතේ අභියාචනාධිකරණය වෙත කරන ලද අභියාචනයක් සම්බන්ධයෙන් අභියාචනාධිකරණය විසින් අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා කළ තීරණය ස්ථිර කිරීම, ප්‍රතිශෝධනය කිරීම, වෙනස් කිරීම හෝ ඉවත ලෑම කරනු ලැබිය හැකි අතර, යුක්තිය ඉටු කිරීම පිණිස අවශ්‍ය විත ආඥාවක් කරනු ලැබිය හැකි ය.

ඒකක භාරයකට අදාළ භාර ඔප්පුව සංශෝධනය කිරීම.

31ඊ. (1) කොමිෂන් සභාවේ ලියවිල්ලකින් වූ පූර්ව අනුමැතිය නොමැතිව බලපත්‍රලත් ඒකක භාරයක භාර ඔප්පුව සංශෝධනය කරනු නොලැබිය යුතු ය.

(2) බලපත්‍රලත් ඒකක භාරයක භාරකරු විසින් එම ඒකක භාරයේ භාර ඔප්පුව සංශෝධනය කිරීමට අදහස් කරන අවස්ථාවක, ඔහු විසින් එම යෝජිත සංශෝධනය කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද යෝජිත සංශෝධන ලැබී දින විසි එකක් ඇතුළත දී, කොමිෂන් සභාව විසින්, භාර ඔප්පුවලට යෝජිත සංශෝධනවලට ඉඩ දෙනු ලැබේද නැද්ද යන වග සඳහන් කරමින් ලියවිල්ලකින් වූ දැන්වීමක්, කළමනාකරණ සමාගම සහ භාරකරු වෙත දෙනු ලැබිය යුතු ය.

එවැනි සංශෝධනවලට ඉඩ දෙනු නොලබන අවස්ථාවල, එසේ ඉඩ නොදීමට හේතු කොමිෂන් සභාව විසින් සඳහන් කරනු ලැබිය යුතු ය.

(4) (3) වන උපවගන්තිය යටතේ දැන්වීම ලැබුණු විට, භාරකරු, වහා ම එම දැන්වීමට අනුව ක්‍රියා කළ යුතු ය.

සපයා ඇති විස්තර කිසිවක් වෙනස් කිරීම.

31උ. 31අ වගන්තිය යටතේ බලපත්‍රලත් තැනැත්තකු බලපත්‍රයක් සඳහා වූ තම ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් විස්තර කිසිවක් වෙනස් කිරීමට අදහස් කරන්නා වූ හෝ 31අ වගන්තිය යටතේ බලපත්‍රයක් සඳහා වූ ඉල්ලුම් පත්‍රයෙහි දක්වා ඇති තත්ත්වයෙන් වෙනසකට පත් වන්නා වූ හෝ එසේ වෙනස් වීමට අදහස් කරන්නා වූ හෝ අවස්ථාවක එවැනි වෙනසක් කිරීමට පෙර, කොමිෂන් සභාව වෙත ඒ බව දන්වා එහි පූර්ව කැමැත්ත ලබා ගැනීම ඒ තැනැත්තාගේ යුතුකම විය යුතු ය.

"ඒකක භාරය" හෝ "බලපත්‍රලත් ඒකක භාරය" යන වචන භාවිතය සීමා කිරීම.

31ඌ. කිසිම තැනැත්තකු විසින්, ඔහුට 31අ වගන්තිය යටතේ ඒකක භාරයක් පවත්වා ගෙන යාමට අවසර ලැබී ඇත්නම් මිස, "ඒකක භාරය" හෝ "බලපත්‍රලත් ඒකක භාරය" යන වචන භාවිත කරනු නොලැබිය යුතු ය.

ඒකක භාරයක ආයෝජනය කරන ලෙස ආරාධනා කරමින් දැන්වීම් නිකුත් කිරීම සීමා කිරීම.

31එ. කිසිම තැනැත්තකු විසින් බලපත්‍රලත් ඒකක භාරයක ඒකකවල ආයෝජන කරන ලෙස මහජනතාවට ආරාධනය කරමින් (කොමිෂන් සභාව විසින් රීති මගින් අත් හරින ලද දැන්වීම් නොවන) සංස්ථා ප්‍රකාශයක් හෝ දැන්වීමක් අවස්ථාවෝචිත පරිදි එම සංස්ථා පත්‍රයෙහි අඩංගු කරුණු හෝ දැන්වීමෙහි සඳහන් පෙළ හෝ නිකුත් කිරීම සඳහා නැතහොත් පළ කිරීම සඳහා ලියවිල්ලකින් වූ පූර්ව අනුමැතිය කොමිෂන් සභාවෙන් ලබාගෙන ඇත්නම් මිස, නිකුත් කිරීම හෝ පළ කිරීම කරනු නොලැබිය යුතු ය.

භාරය කඩ කිරීම සම්බන්ධයෙන් භාරකරුවන්ගේ වගකීම සීමා කිරීම.

31ඒ. (1) භාර ආඥාපනතෙහි හෝ වෙනත් යම් නීතියක හෝ කුමක් සඳහන් ව ඇත ද, බලපත්‍රලත් ඒකක භාරයක කළමනාකරණ සමාගම විසින් කරනු ලැබූ යම් ක්‍රියාවකින් උද්ගත වන භාරය සම්බන්ධයෙන් වූ කිසියම් කඩ කිරීමක්—

(අ) එම භාරකරුගේ එකඟත්වය ලබා නොගෙන එම ක්‍රියාව කර ඇත්නම්;

(ආ) එම භාරකරුගේ එකඟත්වය ලබාගෙන එම ක්‍රියාව කර ඇත්නම් සහ එම එකඟත්වය අවස්ථාවෝචිත පරිදි, භාර දේපළවලට අදාළ වූ යම් කරුණක් සම්

සම්බන්ධයෙන් එම කළමනාකරණ සමාගම විසින් එම භාරකරු වෙත සපයන ලද කිසියම් ලිඛිත ප්‍රකාශයක් හෝ කරුණු දැක්වීමක් කෙරෙහි විශ්වාසය තබමින් හෝ එම භාරකරුගෙන් ස්වාධීනව කළමනාකරණ සමාගම විසින් ලබා ගන්නා ලද කිසියම් වෘත්තිය උපදෙස් කෙරෙහි විශ්වාසය තබමින් සද්භාවයෙන් දී ඇත්නම්,

ඒ සඳහා ඒ ඒකක භාරයෙහි භාරකරු වගකිව යුතු නොවන්නේ ය.

(2) වංචාව හෝ නොසැලකිල්ල නිසා භාරයක් සම්බන්ධයෙන් සිදු වූ කඩ කිරීමක් සඳහා උද්ගත වන වගකීමෙන්, මේ වගන්තියේ (1) වන උපවගන්තියෙහි සඳහන් කිසිවක් නිසා භාරකරු නිදහස් කරනු ලබන්නේ යැයි නොසැලකිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය සංශෝධනය කිරීම.

24. ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය මෙහි පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ—

(අ) "(8) වන උපවගන්තියේ" යන වචන සහ "දැනුවත්ව සම්බන්ධයක් ඇත්තා වූ" යන වචන වෙනුවට, පිළිවෙලින් "(8) වන සහ (9) වන උපවගන්තිවල" සහ "සම්බන්ධයක් ඇත්තා වූ" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) ඒ උපවගන්තියේ (ඇ) ඡේදයේ, "තොරතුරු ලෙස ඔහු දන්නා වූ" යන වචන වෙනුවට "තොරතුරු ලෙස ඔහු දන්නවා ඇතැයි සාධාරණව බලාපොරොත්තු විය හැකි වූ" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ—

(අ) "දැනුවත්ව සම්බන්ධයක් ඇත්තා වූ" සහ "දැනුවත්ව සම්බන්ධයක් තිබුණා වූ" යන වචන වෙනුවට පිළිවෙලින් "සම්බන්ධයක් ඇත්තා වූ" සහ "සම්බන්ධයක් තිබුණා වූ" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) ඒ උපවගන්තියේ (ආ) ඡේදයේ "සඳහා හැර, අනාවරණය නොකළ යුතුයයි" යන වචන වෙනුවට "සඳහා හැර අනාවරණය නොකළ යුතු යයි" යන වචන ආදේශ කිරීමෙන් ;

(ඇ) ඒ උපවගන්තියේ (ඇ) ඡේදයේ "තොරතුරු යැයි ඔහු දරන්නා වූ" යන වචන වෙනුවට "තොරතුරු යැයි ඔහු දන්නවා ඇතැයි යුක්ති සහගතව බලාපොරොත්තු විය හැකි වූ" යන වචන ආදේශ කිරීමෙන් ;

(3) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ—

(අ) ඒ උපවගන්තියේ (අ) ඡේදයෙහි "කෙලින්ම හෝ අන්‍යාකාරයකින් ඇනුවත්ව ම ලබාගන්නා ලද තොරතුරක් ඇත්තා වූ හෝ" යන වචන වෙනුවට "කෙලින්ම හෝ අන්‍යාකාරයකින් ලබා ගන්නා ලද හෝ ලබාගෙන ඇතැයි විශ්වාස කිරීමට යුක්ති සහගත හේතු ඇති තොරතුරක් ඇත්තා වූ" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) ඒ උපවගන්තියේ (ආ) ඡේදයේ (i) වන අනුඡේදයේ "තොරතුරක් බව ඔහු දන්නේ නම්" යන වචන වෙනුවට "තොරතුරක් බව ඔහු දන්නවා ඇතැයි යුක්තිසහගතව බලාපොරොත්තු විය හැකිනම් " යන වචන ආදේශ කිරීමෙන් ;

(ඇ) ඒ උපවගන්තියේ (ආ) ඡේදයේ (ii) වන අනුඡේදයේ "තොරතුරක් බව ඔහු දන්නේ නම්" යන වචන වෙනුවට "තොරතුරක් බව ඔහු දන්නවා ඇතැයි යුක්ති සහගතව බලාපොරොත්තු විය හැකි නම්" යන වචන ආදේශ කිරීමෙන්, සහ "සම්බන්ධ බව ඔහු දන්නේ නම්" යන වචන වෙනුවට "සම්බන්ධ බව ඔහු දන්නවා ඇතැයි යුක්ති සහගතව බලාපොරොත්තු විය හැකි නම්" යන වචන ආදේශ කිරීමෙන් ;

(4) ඒ වගන්තියේ (4) වන උපවගන්තියේ "තොරතුරක් යැයි ඒ පුද්ගලයා දන්නේ නම්" යන වචන වෙනුවට "තොරතුරක් යැයි ඒ පුද්ගලයා දන්නවා ඇතැයි යුක්ති සහගතව බලාපොරොත්තු විය හැකි නම්" යන වචන ආදේශ කිරීමෙන් ;

(5) ඒ වගන්තියේ (5) වන උපවගන්තිය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(5) (8) වන සහ (9) වන උපවගන්තිවල විධිවිධාන වලට යටත්ව, යම් පුද්ගලයකු විසින් (4) වන උපවගන්තියේ විධිවිධාන අදාළ වන්නා වූ පුද්ගලයකුගෙන්, (4) වන උපවගන්තියේ සඳහන් අර්පණය ගැන කල්පනා කරනු ලබන බවට හෝ තවදුරටත් ඒ ගැන කල්පනා නොකරන බවට තොරතුරක් ලබාගෙන ඇති හෝ ලබාගෙන ඇතැයි විශ්වාස කිරීමට යුක්ති සහගත හේතු ඇති අවස්ථාවක, ඒ තොරතුර එම සමාගමේ ලැයිස්තුගත සුරැකුම්පත්වලට අදාළ එළි නොකළ මිල පිළිබඳ සංවේදී තොරතුරක් බව ඔහු දන්නවා ඇතැයි යුක්ති සහගතව බලාපොරොත්තු විය හැකි නම් පළමු සඳහන් පුද්ගලයා විසින් ම ඒ සමාගමේ ලැයිස්තුගත සුරැකුම්පත් වෙළඳාම් කිරීම නොකළ යුතු ය.".

(6) ඒ වගන්තියේ (8) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ (1) වන අනුඡේදයේ "තොරතුරු ලබාගන්නා ලද්දේ නම්; සහ" යන වචන වෙනුවට "තොරතුරු ලබාගන්නා ලද්දේ නම්; සහ" යන වචන ආදේශ කිරීමෙන් ;

(7) ඒ වගන්තියේ (9) වන උපවගන්තියේ "ගනුදෙනුව සම් පූර්ණ කිරීම" යන වචන වෙනුවට "ගනුදෙනුව සම්පූර්ණ කිරීම" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තිය සංශෝධනය කිරීම.

25. ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තිය මෙහි පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ "සංවේදී තොරතුරක් බව එය දරන පුද්ගලයා දන්නා වූ යම් තොරතුරක්" යන වචන වෙනුවට "සංවේදී තොරතුරක්" යන වචන ආදේශ කිරීමෙන් :—

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ (ඇ) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ඇ) (2) වන උපවගන්තියේ සඳහන් පරිදි ඔහු දැන සිටි හෝ ඔහු විසින් ලබාගන්නා ලද තොරතුර වෙනත් යම් තැනැත්තකුට දැනුම් දීම, ඒ තොරතුර ඒ තැනැත්තා විසින් හෝ වෙනත් යම් තැනැත්තකු විසින් හෝ ඒ අදාළ සුරැකුම්පත් වෙළඳාම් කිරීමට වෙනත් යම් තැනැත්තකුට උපදෙස් දීමේ හෝ සැලැස්වීමේ කාර්යය සඳහා පාවිච්චි කරනු ලබන බව දන්නේ නම් හෝ ඒ බව විශ්වාස කිරීමට යුක්තිසහගත හේතු ඇත් නම් හෝ, නොකළ යුතුය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 35 වන වගන්තිය සංශෝධනය කිරීම.

26. ප්‍රධාන ප්‍රඥප්තියේ 35 වන වගන්තිය, එහි (2) වන උපවගන්තියේ (ආ) ඡේදය ඉවත්කොට ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(ආ) 14 වන වගන්තියේ (අ) ඡේදය යටතේ සියලු පරීක්ෂණ පැවැත්වීමෙහි ලා දරන ලද ගාස්තු වශයෙන් නියම කරනු ලබන සියලු මුදල් ප්‍රමාණයන් හෝ 15 වන වගන්තිය, 20 වන වගන්තිය සහ 31අ වගන්තිය යටතේ ගාස්තු වශයෙන් ගෙවනු ලැබූ සියලු මුදල් ප්‍රමාණයන් ;".

ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තිය සංශෝධනය කිරීම.

27. ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තිය, එහි (2) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(2) වන්දි අරමුදල—

(අ) අරමුදලේ කාර්ය සඳහා පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලබන මුදල් ප්‍රමාණවලින් ;

(ආ) 51අ වගන්තිය යටතේ අරමුදලට බැර කරනු ලබන
මුදල් ප්‍රමාණවලින්
සමන්විත විය යුතු ය.".

28. ප්‍රධාන ප්‍රඥප්තියේ 39 වන වගන්තිය, එහි (2) වන උප වගන්තියේ "සියලු කාර්ය සඳහා" යන වචන වෙනුවට "මේ පනතේ කාර්ය සඳහා" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 39 වන වගන්තිය සංශෝධනය කිරීම.

29. ප්‍රධාන ප්‍රඥප්තියේ 42 වන වගන්තිය මෙහි පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 42 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ, "අමාත්‍යවරයා විසින් සභාවේ අදහස් විමසා" යන වචන වෙනුවට "අමාත්‍යවරයා විසින් කොමිෂන් සභාවේ නිර්දේශය මත" යන වචන ආදේශ කිරීමෙන් : ".

(2) ඒ වගන්තියේ (4) වන උපවගන්තියේ, "අධ්‍යක්ෂ ජනරාල්වරයා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි අතර" යන වචන වෙනුවට, "අධ්‍යක්ෂ ජනරාල්වරයා කොමිෂන් සභාවේ නිර්දේශය මත ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි අතර" යන වචන ආදේශ කිරීමෙන්.

30. ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තිය, එහි (1), (2) යන (3) වන උපවගන්ති ඉවත් කොට ඒ වෙනුවට, මෙහි පහත දැක්වෙන උපවගන්ති ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(1) (අ) යම් බලපත්‍රලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක හෝ, ඒ විනිමය ස්ථානයේ බලපත්‍රලත් ව්‍යාපාර වස්තු තැරැව්කරුවකුගේ නැතහොත් ව්‍යාපාර වස්තු වෙළෙන්දකුගේ හෝ යම් ලැයිස්තුගත සමාගමක හෝ බලපත්‍රලත් යම් ඒකක භාරයක කළමනාකාර සමාගමක, වෘත්තීය පැවැත්ම පිළිබඳව හෝ කටයුතු පිළිබඳව, ලැයිස්තුගත පොදු සමාගමක කොටස් හිමියන් හෝ බලපත්‍රලත් ඒකක භාරයක ඒකක හිමියන් විසින් කරනු ලබන පැමිණිලි ;

(ආ) යම් බලපත්‍රලත් ව්‍යාපාර වස්තු තැරැව්කරුවකු හෝ ව්‍යාපාර වස්තු වෙළෙන්දකු විසින්, ඒ ව්‍යාපාර වස්තු තැරැව්කරු හෝ ව්‍යාපාර වස්තු වෙළෙන්දා සාමාජිකයකු වන බලපත්‍රලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක වෘත්තීය පැවැත්ම හෝ කටයුතු පිළිබඳව, කරන පැමිණිලි

විභාග කර තීරණය කිරීම සඳහා කොමිෂන් සභාව විසින්, කොමිෂන් සභාවේ සාමාජිකයන් තිදෙනකුගෙන් සමන්විත කමිටුවක් පිහිටුවනු ලැබිය හැකි ය.

(2) යම් කොටස් හිමියකු හෝ ඒකක හිමියකු හෝ බලපත්‍රලත් ව්‍යාපාර වස්තු තැරැව්කරුවකු හෝ ව්‍යාපාර වස්තු වෙළෙන්දකු විසින් කරන ලද ලිඛිත පැමිණිල්ලක් ලැබුණු විට, ඒ පැමිණිල්ල සනාථ කිරීම සඳහා යම් ලියවිලි හෝ වෙනත් සාක්ෂි ඉදිරිපත් කර ඇත්නම්, ඒවා පරීක්ෂාකර බලා, අවස්ථාවෝචිත පරිදි, ඒ බලපත්‍රලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය හෝ බලපත්‍රලත් ව්‍යාපාර වස්තු තැරැව්කරු හෝ ව්‍යාපාර වස්තු වෙළෙන්දකු හෝ ලැයිස්තුගත සමාගම හෝ ඒ බලපත්‍රලත් ඒකක භාරයේ කළමනාකාර සමාගම හෝ විසින් මේ පනතේ විධිවිධාන හෝ මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ රීතියක් හෝ උල්ලංඝනය කර තිබේ ද යන වග හෝ ඒ බලපත්‍රලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයේ යම් රීතියක් උල්ලංඝනය කර තිබේ ද යන වග ඒ කමිටුව විසින් තීරණය කළ හැකි ය. කරුණු ඉදිරිපත් කිරීමේ අවස්ථාවක් එම බලපත්‍රලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයට හෝ බලපත්‍රලත් ව්‍යාපාර වස්තු තැරැව්කරුට හෝ ව්‍යාපාර වස්තු වෙළෙන්දාට හෝ ලැයිස්තුගත සමාගමට හෝ කළමනාකාර සමාගමට හෝ නොදී, එවැනි තීරණයක් නොකළ යුතු ය.

(3) අවස්ථාවෝචිත පරිදි, බලපත්‍රලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක් හෝ බලපත්‍රලත් ව්‍යාපාර වස්තු තැරැව්කරුවකු හෝ ව්‍යාපාර වස්තු වෙළෙන්දකු හෝ ලැයිස්තුගත සමාගමක් හෝ යම් බලපත්‍රලත් ඒකක භාරයක කළමනාකාර සමාගම හෝ විසින් මේ පනතේ විධිවිධාන හෝ මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ රීතියක් හෝ උල්ලංඝනය කර ඇති බව හෝ ඒ බලපත්‍රලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයේ රීතියක් උල්ලංඝනය කර ඇති බව කමිටුව විසින් තීරණය කරනු ලැබූ අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, ඒ බලපත්‍රලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයට හෝ බලපත්‍රලත් ව්‍යාපාර වස්තු තැරැව්කරුට හෝ ව්‍යාපාර වස්තු වෙළෙන්දාට හෝ ලැයිස්තුගත සමාගමට හෝ කළමනාකාර සමාගමට හෝ විරුද්ධව ගත යුතු ක්‍රියා මාර්ගයේ ස්වභාවය කමිටුව විසින් කොමිෂන් සභාවට නිර්දේශ කළ යුතු ය. එම නිර්දේශ ක්‍රියාත්මක කිරීම හෝ වැඩිදුර විමර්ශනය සඳහා එම කාරණය නිසි බලධරයා වෙත යොමු කිරීම හෝ අරභයා ස්වකීය අභිමතය පරිදි ක්‍රියා කිරීමට කොමිෂන් සභාවට බලය ඇත්තේ ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 51 වන වගන්තිය සංශෝධනය කිරීම.

31. ප්‍රධාන ප්‍රඥප්තියේ 51 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ—

(අ) (අ) ඡේදයෙහි, "පනත යටතේ සාදන යම් නියෝගයක" යන වචන වෙනුවට "පනත යටතේ සාදන ලද යම් නියෝගයක හෝ රීතියක" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) (ආ) ඡේදයෙහි "අසත්‍ය හෝ සාවද්‍ය යම් තොරතුරක්" යන වචන වෙනුවට "අසත්‍ය හෝ සාවද්‍ය හෝ මුලා කරන සුළු යම් තොරතුරක්" යන වචන ද "අසත්‍ය හෝ සාවද්‍ය කරුණු" යන වචන වෙනුවට "අසත්‍ය හෝ සාවද්‍ය හෝ, මුලා කරන සුළු කරුණු" යන වචන ද ආදේශ කිරීමෙන් ;

(ඇ) (ඇ) ඡේදයෙහි "සභාවේ නිලධරයකුට හෝ සේවකයකුට මේ පනත යටතේ ඔහුගේ කාර්ය ඉටුකිරීමේ දී" යන වචන වෙනුවට "කොමිෂන් සභාවේ නිලධරයකුට හෝ සේවකයකුට හෝ, 23අ වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ කොමිෂන් සභාව යම් තැනැත්තකු සමග ගිවිසුමකට ඇතුළත් වී ඇද්ද ඒ යම් තැනැත්තකුට හෝ මේ පනත යටතේ ඔහුගේ කාර්ය ඉටු කිරීමේදී" යන වචන ආදේශ කිරීමෙන්.

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ "වරදකරු කරනු ලැබූ විට" යන වචන වෙනුවට "වරදකරු කරනු ලැබූ විට" යන වචන ආදේශ කිරීමෙන්.

32. මෙහි පහත දැක්වෙන අලුත් වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියේ 51 වන වගන්තියට ඉක්බිතිවම මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ප්‍රධාන ප්‍රඥප්තියේ 51අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතුය :— ප්‍රධාන ප්‍රඥප්තියේ 51අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

"වැරදි සමථයට පත් කිරීම. 51අ. මේ පනත යටතේ වූ වරදක් සිදුකර ඇත්තේ කිනම් අවස්ථාගත තත්ත්වයකදී ද යන කාරණය සැලකිල්ලට ගෙන, කොමිෂන් සභාව විසින්, ඒ වරද සම්බන්ධයෙන් නියම කළ හැකි උපරිම දඩයෙන් තුනෙන් එකක් නොඉක්මවන මුදල් ප්‍රමාණයකට සීමාකොට ඒ වරද සමථයට පත් කළ හැකි අතර, මේ වගන්තිය යටතේ වැරදි සමථයට පත් කිරීමෙහි දී කොමිෂන් සභාවට ලැබෙන සියලු මුදල් ප්‍රමාණයන්, 38 වන වගන්තිය යටතේ පිහිටුවන ලද වන්දි අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.".

33. ප්‍රධාන ප්‍රඥප්තියේ 53 වන වගන්තිය, මෙහි පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 53 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තිය, ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ලෙස අංක යෙදීමෙන් ;

(2) නැවත අංක යොදන ලද (1) වන උපවගන්තියේ—

(අ) (ආ) ඡේදයෙහි "වෙළෙන්දන් විසින් කොටස් ගනුදෙනු සම්බන්ධයෙන්" යන වචන වෙනුවට "බලපත්‍රලාභී ව්‍යාපාර වස්තු තැරැව්කරුවන් සහ ව්‍යාපාර වස්තු වෙළෙන්දන් විසින් කොටස් ගනු

දෙනු සම්බන්ධයෙන් හා බලපත්‍රලත් ඒකක භාර යක ඒකකවලට අදාළ ගනුදෙනු සම්බන්ධයෙන් " යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) (ඇ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ඇ) බලපත්‍රලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථාන යක් හෝ බලපත්‍රලත් ව්‍යාපාර වස්තු තැරැව් කරුවකු නැතහොත් වෙළෙන්දකු විසින් හෝ බලපත්‍රලත් ඒකක භාරයක කළමනා කාර සමාගම විසින් හෝ පොත්, වාර්තා ගිණුම් සහ විගණන නිසි ලෙස පවත්වා ගෙන යාම සහ එම බලපත්‍රලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය විසින් හෝ බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු තැරැව්කරු විසින් නැත හොත් වෙළෙන්දා විසින් හෝ කළමනාකාර සමාගම විසින් හෝ ස්වකීය කටයුතු පිළිබඳව කොමිෂන් සභාව වෙත නිතිපතා වාර්තා කිරීම ; ";

(ඇ) (ඇ) ඡේදයට ඉක්බිතිව ම මෙහි පහත දැක්වෙන ඡේද ඇතුළත් කිරීමෙන් :—

"(ඈ) බලපත්‍රලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථාන යක්, බලපත්‍රලත් ව්‍යාපාර වස්තු තැරැව් කරුවකු හා ව්‍යාපාර වස්තු වෙළෙන්දකු සහ බලපත්‍රලත් ඒකක භාරයක කළමනාකාර සමාගම විසින් පවත්වාගෙන යනු ලබන පොත්පත්, වාර්තා සහ ගිණුම් පිළිබඳ වාර්ෂික විගණනය හා මුදල් ප්‍රකා ශය පිළියෙල කිරීම ;

(ඉ) අත්කර ගැනීම් හෝ ඒකාබද්ධවීම් ලැයිස්තු ගත සමාගම් එකක් හෝ වැඩි සංඛ්‍යා වක් අතර සිදුවන නැතහොත් එවැනි අත්කර ගැනීමක හෝ ඒකාබද්ධ වීමක යටත් පිරිසෙයින් එක් පාර්ශ්වයක් ලැයිස්තුගත සමාගමක් වන අවස්ථාවක, එම අත්කර ගැනීම් හෝ ඒකාබද්ධවීම් විධිමත් කිරීම.

(ඊ) බලපත්‍රලත් ඒකක භාරයක භාරකරු සහ කළමනාකාර සමාගම විසින් පිළිපැදිය යුතු චර්යා ධර්ම සංග්‍රහයන් ;

(උ) රීති සෑදීමට මේ පනතින් නියමිත කාරණා. ";

(3) නැවත අංක යොදන ලද (1) වන උපවගන්තියට ඉක්බිතිව ම, මෙහි පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් :—

"(2) (1) වන උපවගන්තිය යටතේ සාදනු ලබන සෑම රීතියක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එය එසේ පළකරනු ලැබූ දිනයේ සිට හෝ එහි නිශ්චිතව සඳහන් වන වෙනත් යම් පසු දිනයක සිට හෝ ක්‍රියාත්මක විය යුතු ය.".

34. ප්‍රධාන ප්‍රඥප්තියේ 55 වන වගන්තිය, පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 55 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) "ආයෝජක" යන්නෙහි අර්ථකථනයට පෙරාතුව ම මෙහි පහත දැක්වෙන අර්ථකථනය ඇතුළත් කිරීමෙන් :—

"සම්බන්ධිත තැනැත්තා" යන්න ඒකක භාරයක භාරකරු හෝ කළමනාකාර සමාගම සම්බන්ධයෙන් යෙදෙන විට, එයින්—

(අ) භාර සමාගමේ හෝ කළමනාකාර සමාගමේ සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනයෙන් යම් නියමිත ප්‍රතිශතයක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් කෙළින්ම හෝ අන්‍යාකාරයකින් අයත්ව සිටින හෝ, භාර සමාගමේ හෝ කළමනාකාර සමාගමේ සම්පූර්ණ ඡන්ද සංඛ්‍යාවෙන් යම් නියමිත ප්‍රතිශතයක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් කෙලින්ම හෝ අන්‍යාකාරයකින් හෝ ක්‍රියාත්මක කිරීමට හැකියාවක් ඇති තැනැත්තෙක් ;

(ආ) භාර සමාගම සහ කළමනාකාර සමාගම විසින් එක්ව කෙලින්ම හෝ අන්‍යාකාරයකින් යම් සමාගමක සාමාන්‍ය ප්‍රාග්ධනයෙන් යම් නියමිත ප්‍රතිශතයක හෝ ඊට වැඩි ප්‍රමාණයක අයිතිය දරන්නේ ද නැතහොත් භාර සමාගම යම් සමාගමක මුළු ඡන්ද සංඛ්‍යාවෙන් යම් නියමිත ප්‍රතිශතයක් හෝ ඊට වැඩි ප්‍රමාණයක කෙලින්ම හෝ අන්‍යාකාරයකින් දරන්නේ ද එවැනි යම් සමාගමක් ;

(ඇ) භාර සමාගමෙහි, කළමනාකාර සමාගමෙහි හෝ (ආ) ඡේදයේ සඳහන් සමාගමක අධ්‍යක්ෂවරයෙක් හෝ නිලධරයෙක්

අදහස් වේ.' ;

(2) "ලැයිස්තුගත සුරැකුම්පත්" යන්නෙහි අර්ථකථනයට ඉක්බිතිව ම මෙහි පහත දැක්වෙන අර්ථකථනය ඇතුළත් කිරීමෙන් :—

"කළමනාකාර සමාගම" යන්න බලපත්‍රලත් ඒකක භාරයක් සම්බන්ධයෙන් යෙදෙන විට, එයින් සමාගම් සංස්ථාගත කිරීම සඳහා තත්කාලයෙහි බලපවත්නා නීතිය යටතේ සංස්ථාගත කරන ලද සමාගමක්

වන්නා වූ හෝ යම් ලිඛිත නීතියක් මගින් හෝ ඒ යටතේ හෝ පිහිටුවනු ලද යම් සංස්ථාවක් වන්නා වූ ද ඒ ඒකක භාරයේ භාරකරු විසින් දරනු ලබන දේපළ ඒ ඒකක භාරයේ ඒකක හිමියන්ගේ අර්ථලාභය සඳහා කළමනාකරණය කරන්නා වූ ද සමාගමක් අදහස් වේ.';

(3) "සුරකුම්පත්" යන්නෙහි අර්ථකථනය ඉවත් කොට ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන අර්ථකථනය ආදේශ කිරීමෙන් :—

'"සුරකුම්පත්" යන්නෙන්, යම් ආණ්ඩුවක් විසින් හෝ සංස්ථාගත කළ හෝ සංස්ථාගත නොකළ යම් මණ්ඩලයක් විසින් හෝ නිකුත් කරන ලද නැතහොත් නිකුත් කිරීමට යෝජිත යම් අයිතිවාසිකමක්, විකල්පයක් හෝ (ඒකක වශයෙන් හෝ අන්‍යාකාරයකින් හෝ විස්තර කරන ලද්දේ වුව ද) එහි හෝ ඒ පිළිබඳ සම්බන්ධතාවක් ද ඇතුළුව, ඩිබෙන්චරයක්, ව්‍යාපාර වස්තුවක්, කොටසක්, අර මුදල් හෝ නෝට්ටුවක් හෝ සුරකුම්පත් යනුවෙන් සාමාන්‍යයෙන් හඳුන්වනු ලබන වෙනත් යම් සාධන පත්‍රයක් අදහස් වන අතර, විනිමය බිල් පත්‍රයක් හෝ බැංකුවක් විසින් නිකුත් කරන ලද පොරොන්දු නෝට්ටුවක් හෝ තැන්පතු සහතිකයක් ඊට ඇතුළත් නොවේ.';

(4) ඒ වගන්තිය අගට මෙහි පහත දැක්වෙන අලුත් අර්ථකථන ඇතුළත් කිරීමෙන් :—

'"භාරකරු" යන්න බලපත්‍රලත් ඒකක භාරයක් සම්බන්ධයෙන් යෙදෙන විට, ඒ ඒකක භාරය පිහිටුවනු ලැබූ සාධන පත්‍රයෙහි භාරකරු වශයෙන් පත් කර ඇති තැනැත්තා අදහස් වේ;

"ඒකක හිමියා" යන්න ඒකක භාරයක් සම්බන්ධයෙන් යෙදෙන විට, ඒ ඒකක භාරය යටතේ ඒකක සහතිකයක හිමියකු ලෙස එම භාරය විසින් තත් කාලයෙහි ලියාපදිංචි කර සිටින තැනැත්තා අදහස් වේ;

"ඒකක භාරය" යන්නෙන් යම් භාරයක ලාභ හෝ ආදායම් සහ ඒ භාරයේ භාරකරුවන් වෙත සතු වී තිබෙන සුරකුම් පත් හෝ වෙනත් යම් දේපළ අත්කර ගැනීමෙන්, දැරීමෙන්, කළමනාකරණයෙන් හෝ බැහැර කිරීමෙන් උපදින ප්‍රාග්ධන ලාභවලට, භාරය යටතේ අර්ථලාභීන් වශයෙන් තැනැත්තන්ට සහභාගිකරුවන් වීම සඳහා විධිවිධාන සැලැස්වීමේ කාර්යය සඳහා සකස් කරන ලද නැතහොත් ඒ ප්‍රතිඵලය ඇති වන වැඩ පිළිවෙලක් අදහස් වේ.'.

ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනය සංශෝධනය කිරීම.

35. ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනය, එහි I වන කොටස පහත දැක්වෙන පරිදි සංශෝධනය කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ කොටසෙහි (උ) විෂයය වෙනුවට පහත දැක්වෙන විෂයය ආදේශ කිරීමෙන් :—

"(උ) ඉල්ලුම්කාර සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද සාමාජිකයන් නව දෙනෙකුගෙන් සමන්විත විය යුතු බව සහ ඔවුන් අතුරෙන් පස් දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවක් පුද්ගලිකවම ව්‍යාපාර වස්තු තැරැව්කරුවන් හෝ ව්‍යාපාර වස්තු වෙළෙන්දන් වන තැනැත්තන් අතුරෙන් සාමාජිකයන්ගේ මහා මණ්ඩලය විසින් තෝරා පත් කර ගනු ලැබිය යුතු අතර හතර දෙනෙකුට නොඅඩු සංඛ්‍යාවක් කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලද තැනැත්තන් අතුරෙන් අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතු බව ;";

(2) එම කොටසේ (එ) විෂයයෙහි "මුදල් තත්ත්වය සතුටු දායක බව ;" යන වචන වෙනුවට "මුදල් තත්ත්වය සතුටුදායක බව ;" යන වචන ආදේශ කිරීමෙන් ;

(3) එම කොටසේ (ඒ) (ii) විෂයයෙහි "අවංක භාවයකින් යුක්ත නොවන අය" යන වචන වෙනුවට "අවංකභාවයකින් යුක්ත නොවන අය" යන වචන ආදේශ කිරීමෙන්;

(4) එම කොටසේ (ඒ) (viii) විෂයයෙහි "තතුදත් ආයෝ ජන" යන වචන වෙනුවට "තතුදත් ආයෝජන" යන වචන ආදේශ කිරීමෙන්;

(5) එම කොටසේ (ඒ) (ix) විෂයයෙහි "චිරප්‍රසාදවත් තොරතුරු ඇතැම් පුද්ගලයන්ගේ විනය" යන වචන වෙනුවට "චිරප්‍රසාද ලත් තොරතුරු ඇතැම් පුද්ගලයන් විසින්" යන වචන ආදේශ කිරීමෙන් ;

(6) එම කොටසේ (ඒ) (xi) විෂයයෙහි "ව්‍යාපාර වස්තු තැරැව්කරුවන්ගේ මුදල් ගනුදෙනු" යන වචන වෙනුවට "ව්‍යාපාර වස්තු තැරැව්කරුවන්ගේ හා ව්‍යාපාර වස්තු වෙළෙඳුන්ගේ මුදල් ගනුදෙනු" යන වචන ආදේශ කිරීමෙන් ;

(7) එම කොටසේ (ඒ) (xiii) සහ (xiv) යන විෂයයන් වෙනුවට මෙහි පහත දැක්වෙන විෂයයන් ආදේශ කිරීමෙන්—

"(xiii) ව්‍යාපාර වස්තු තැරැව්කරුවන් හෝ ව්‍යාපාර වස්තු වෙළෙන්දන් විසින් සුරැකුම්පත් වෙළඳාම් කිරීම සහ එම ගනුදෙනු සම්බන්ධ තොරතුරු තබාගත යුතු ආකාරය සම්බන්ධයෙන් ;

(xiv) සුරැකුම්පත් තැරැව්කරුවන්ගේ හෝ වෙළෙන්දන්ගේ අනෙකුත් ව්‍යාපාරවලින්, ගනුදෙනුකරුවන්ගේ අරමුදල් සහ සුරැකුම්පත් වෙන්ව තබා ගන්නා බවට වගබලා ගැනීම සඳහා ;";

(8) එම කොටසේ (ඒ) (xiv) විෂයයට ඉක්බිතිව ම මෙහි පහත දැක්වෙන අලුත් විෂයය එකතු කිරීමෙන්—

"(xv) කමිටුවේ සාමාජිකයන්ගෙන් බහුතරය කවර හෝ බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු තැරැව්කරුවකු හෝ ව්‍යාපාර වස්තු වෙළෙන්දකු සමඟ සම්බන්ධයක් නොමැති තැනැත්තන්ගෙන් සමන්විත වන විනය කමිටුවක් පත් කිරීම සඳහා ;";

(9) එම කොටසේ (ඒ) විෂයයට ඉක්බිතිව ම මෙහි පහත දැක්වෙන අලුත් විෂයය එකතු කිරීමෙන්—

"(ඔ) අධ්‍යක්ෂ මණ්ඩලයේ සියලු සාමාජිකයන්ගෙන් යටත් පිරිසෙයින් තුනෙන් දෙකක ඡන්දයකින් පමණක්, ව්‍යාපාර වස්තු විනිමය පාලන නිලධරයන් ඉවත් කළ යුතු බවට ඉල්ලුම්කාර සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියෙන් විධිවිධාන සැලසෙන බව ;";

(10) ඒ උපලේඛනයේ අගට, එහි IV වන කොටස වශයෙන් බලපැවැත්විය යුතු, මෙහි පහත දැක්වෙන කොටස එකතු කිරීමෙන් :—

"IV වන කොටස

ඒකක භාරයක් පවත්වාගෙන යාම පිණිස බලපත්‍රයක් ප්‍රදානය කිරීමේ කාර්යය සඳහා පිළිපැදිය යුතු නියමයන් හා කොන්දේසි මෙසේ ය :—

(අ) ඉල්ලීම කරනු ලබන්නේ යම් ඒකක භාරයක් සම්බන්ධයෙන්ද ඒ ඒකක භාරයේ භාරකරු සහ කළමනාකාර සමාගම, වෙන වෙන ම පුද්ගලයන් විය යුතු ය.

(ආ) භාරකරු, කළමනාකාර සමාගමේ සම්බන්ධිත තැනැත්තකු නොවිය යුතුය ;

(ඇ) එම භාරය ඇතිකරනු ලබන්නේ යම් භාර ඔප්පුවකින් ද ඒ භාර ඔප්පුවෙන් හෝ, භාරකරු සහ කළමනාකාර සමාගම අතර ගිවිසුමෙන්,—

(i) භාර දේපළ ආයෝජනය පිළිබඳ සීමාකිරීම් දැක්විය යුතුය ;

(ii) එම භාර ඔප්පුවෙහි දැක්වෙන යම් අවස්ථාගත තත්ත්වයක් වේ නම්, ඒ තත්ත්වය යටතේ හැර, ඒකක හිමියන් විසින් වැඩිදුර ගෙවීමක් නොකළ යුතු බවට හෝ වැඩිදුර වගකීමක් භාර නොගත යුතු බවට විධිවිධාන සැලසිය යුතුය ;

(iii) ඒකකවල අර්පණ මිල සහ බේරුම් මිල ආගණනය කරන ක්‍රමය දැක්විය යුතුය ;

(iv) ඒකක බේරුම් කිරීම අත්හිටුවන අවස්ථාගත තත්ත්වයක් කවරේදැයි දැක්විය යුතුය ;

(v) ඒකක හිමියන්ගේ ලේඛනයක් පවත්වාගෙන යෑම සඳහා විධිවිධාන සැලැස්විය යුතුය ;

(vi) භාරයේ යම් රැස්වීමක දී තමාගේ වැදගත් සම්බන්ධතාවක් තිබෙන ව්‍යාපාරික කටයුත්තක් සාකච්ඡා කරන විටක දී, තමන්ගේ සම්බන්ධතාව හෙළිදරව් කිරීමට භාරකරුවන්ට, කළමනාකාර සමාගමට සහ ඒවායේ සම්බන්ධිත තැනැත්තන්ට නියම කෙරෙන විධිවිධාන අන්තර්ගත විය යුතුය ;

(vii) ඒකක භාරයේ විගණකවරුන් වශයෙන් කොමිෂන් සභාවේ රීතිවල නිශ්චය කොට දැක්වෙන සුදුසුකම් ඇති තැනැත්තන් පත්කිරීම සඳහා විධිවිධාන සැලසීම සහ ඒ විගණකවරුන් ඒ සුදුසුකම් දැරීම නතර වූ විට ඔවුන් ඉවත් කරන ලෙස නියම කිරීමට කොමිෂන් සභාවට බලය දීම කරනු ලැබිය යුතුය ;

(viii) කළමනාකාර සමාගම (ස්වේච්ඡාවෙන් ඈවර කිරීම හැර) ඈවර කරනු ලැබීමේ දී හෝ කළමනාකාර සමාගමේ යම් වත්කම් සම්බන්ධයෙන් ප්‍රත්‍යාහකයකු පත්කරනු ලැබූ විට හෝ ඒකක හිමියන්ගේ යහපත පිණිස, කළමනාකාර සමාගම වෙනස් කිරීම යෝග්‍ය බවට භාරකරු සෑහීමට පත්වීමේ දී හෝ නිකුත් කරන ලද ඒකකවලින් යටත් පිරිසෙයින් සියයට හැත්තෑපහක් දරන තැනැත්තන් විසින් කළමනාකාර සමාගම පහ කරන ලෙස ඉල්ලා සිටිනු ලැබූ විට හෝ කළමනාකාර සමාගම පහ කිරීමට භාරකරුවන්ට බලය දී තිබිය යුතුය ;

(ix) කළමනාකාර සමාගම පහ කළ විහාම භාරකරු විසින් අනුප්‍රාප්තිකයකු පත් කරනු ලැබීම සඳහා විධිවිධාන සැලැස්විය යුතුය ;

(x) අලුතින් භාරකරුවකු පත් කරන තෙක් භාරකරුට විශ්‍රාම ගැනීම තහනම් කර තිබිය යුතුය ;

(xi) භාරය වෙනුවෙන්, භාරකරුගේ සහ කොමිෂන් සභාවේ අනුමතය ඇතිව හැර, කළමනාකාර සමාගම විසින් ප්‍රතිරක්ෂණ ගිවිසුමකට හෝ උප ආරක්ෂණ ගිවිසුමකට හෝ ඇතුළත් වීම තහනම් කරනු ලැබිය යුතුය ;

(xii) භාරකරුගේ එකඟතාවය ඇතිව හැර, භාර දේපළවලින් ණය දීම හෝ ප්‍රදානය කිරීම තහනම් කරනු ලැබිය යුතුය ;

(xiii) කළමනාකාර සමාගම හෝ කළමනාකාර සමාගමේ යම් සම්බන්ධිත තැනැත්තකු සහ භාරය අතර යම් ගනුදෙනුවක් සඳහා භාරකරුගේ ලිඛිත අනුමතය ලබාගත යුතු බවට විධිවිධාන සැලැස්විය යුතුය ;

(xiv) කළමනාකාර සමාගම වෙත නීතියෙන් පැනුවී තිබෙන යම් වගකීමකින් සමාගම නිදහස් කිරීමක් හෝ ඒකක හිමියන්ගේ අවාසියට එවැනි වගකීමකින් සමාගම ආරක්ෂා කිරීමක් නොකළ යුතුය ;

(xv) අලුතෙන් ඇතිකරන ලද ඒකක වෙනුවෙන් ගෙවන ප්‍රතිෂ්ඨාව භාරකරු වෙත ලැබුණු වහාම ඒ ප්‍රතිෂ්ඨාව (රඳවා ගැනීමට කළමනාකාර සමාගමට හිමිකම තිබෙන යම් අයකිරීම් අඩුකොට) භාරයට යටත් වන බවට විධිවිධාන සැලැස්විය යුතුය ;

(xvi) ඒකක හා සම්බන්ධයෙන් වූ සහතිකයක් තුන්වන පාර්ශ්වයකට භාර දිය යුත්තේ, ඒ ඒකක සඳහා ගෙවන ලද ප්‍රතිෂ්ඨාව (කළමනාකාර සමාගම විසින් රඳවා තබාගත හැකි අයකිරීම් අඩුකොට) භාරකරු වෙත සතුවී ඇති බවට හෝ සතුවන බවට භාරකරු සෑහීමට පත් වූ විටදී පමණක් බවට විධිවිධාන සැලැස්විය යුතුය ;

(xvii) යම් භාර දේපළක්, භාරය විසින් ලබා ගන්නා ලද ණය මුදලක් වෙනුවෙන් ඇප වශයෙන් ණය දෙන්නාගේ නමින් ලියාපදිංචි කර තිබෙන අවස්ථාවක, ඒ දේපළ සම්බන්ධයෙන් ණය දෙන්නාගේ හෝ ඔහුගේ අනුයෝජිතයාගේ යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක් ගැන භාරකරු වගකිව යුතු බවට විධිවිධාන සැලැස්විය යුතුය ;

(xviii) කොමිෂන් සභාවේ අනුමතිය ඇතිව හැර අලුතින් භාරකරුවකු පත් කිරීම තහනම් කළ යුතුය ;

(xix) ඒකකවල ආයෝජනය කිරීමට අවසර ඇති අවම ආරම්භක ආයෝජනය නිශ්චය කොට දැක්විය යුතුය ;

(xx) ඒකක මිලදී ගැනීම්වලින් අය කළ හැකි උපරිම ආරම්භක අයකිරීම නිශ්චය කොට දැක්විය යුතුය ;

(xxi) භාරකරුගේ විෂමාචාරය හෝ නොසැලකිලිමත්කම හේතුකොට ගෙන සිදුවන අලාභ වෙනුවෙන් ඇප වශයෙන්, කොමිෂන් සභාව විසින් නියම් කරනු ලැබූ විට, භාරකරු විසින් ඇප තැන්පත් කළ යුතු බවට විධිවිධාන සැලැස්විය යුතුය. ".

36. සැක දුරු කිරීම පිණිස මෙසේ ප්‍රකාශ කරනු ලැබේ :— ආරක්ෂා කිරීම.

(අ) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වූ දිනයට පෙරාතුව ම වූ දිනයේදී සුරැකුම්පත් සභාවේ ධුර දැරූ සාමාජිකයන්, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සාමාජිකයන් වන්නාක් සේ සැලකිය යුතු අතර, ඒ සුරැකුම්පත් සභාවේ ඒ දිනයෙහි ධුර දැරූ පත්කළ සාමාජිකයන් අතුරෙන්—

(i) 4 වන වගන්තියේ කවර විධිවිධානයක් තිබුණ ද, අමාත්‍යවරයා විසින් තෝරා ගන්නා ලද සාමාජිකයන් දෙදෙනකු, ඔවුන් සභාවේ සාමාජිකයන් වශයෙන් පත් කරනු ලැබූ දින සිට, අවුරුදු හතරක කාලසීමාවක් ධුර දැරිය යුතුය ; තවද

(ii) 4 වන වගන්තියේ කවර විධිවිධානයක් තිබුණ ද, අමාත්‍යවරයා විසින් තෝරා ගන්නා ලද සාමාජිකයන් දෙදෙනෙකු, ඔවුන් සභාවේ සාමාජිකයන් වශයෙන් පත් කරනු ලැබූ දින සිට අවුරුදු පහක කාල සීමාවක් ධුර දැරිය යුතු ය ;

(ආ) සුරැකුම්පත් සභාව විසින් යම් ව්‍යාපාර වස්තු තැරැව්කරුවකුට හෝ ව්‍යාපාර වස්තු වෙළෙන්දෙකුට නිකුත් කරන ලදුව මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වූ දිනයට පෙරාතුව ම බලාත්මකව පැවති සෑම බලපත්‍රයක් ම, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් වූවාක් සේ සැලකිය යුතු ය;

(ඇ) සුරැකුම්පත් සභාව විසින් සාදන ලදුව මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වූ දිනයට පෙරාතුව ම වූ දිනයේ බලාත්මකව පැවති සියලු රීති හා නියෝග ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් සාදන ලද රීති හා නියෝග වූවාක් සේ සැලකිය යුතු ය ;

(ඈ) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වූ දිනයට පෙරාතුව ම වූ දිනයේ පැවති, සුරැකුම්පත් සභාවේ සියලු ගිවිසුම්. එකඟ වීම් සහ වෙනත් සාධන පත්‍ර, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් ඇතුළත් වී තිබෙන ගිවිසුම්, එකඟවීම් සහ වෙනත් සාධන පත්‍ර වූවාක්සේ සැලකිය යුතු ය ;

(ඉ) සුරැකුම්පත් සභාව විසින් හෝ ඊට විරුද්ධව හෝ පවරන ලදුව, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වීමට පෙරාතුව ම දිනය වන විට අවසන් නොවී පැවති සියලු සිවිල් නඩු, නඩු කර සහ වෙනත් නඩු කටයුතු ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් හෝ එයට විරුද්ධව හෝ පවරන ලද සිවිල් නඩු, නඩුකර සහ වෙනත් නඩු කටයුතු වූවාක් සේ සැලකිය යුතු ය.

ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයකට නිකුත් කරන ලද බලපත්‍රයකට පනත අදාළ වීම.

37. ප්‍රධාන ප්‍රඥප්තිය යටතේ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයකට නිකුත් කරන ලදුව, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වූ දිනයට පෙරාතුව වූ දිනයේ බලාත්මකව පැවති බලපත්‍රයක වලංගු කාලය ප්‍රධාන ප්‍රඥප්තියේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වූ දින සිට දවස් අනූවක කාල සීමාවක් ඉකුත් වීමේ දී, අවසන් වූවාක් සේ සැලකිය යුතුය.

අනනුකූලතාවක් ඇතිවූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

38. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.